# පසුව ඇතිවන සිදුවීම්

# SUBSEQUENT EVENTS S.L.Au.S - 560

## පසුව ඇතිවන සිදුවීම් - SUBSEQUENT EVENTS S.L.Au.S - 560

- හැඳින්වීම
- පසුව ඇතිවන සිදුවීම් යනු
- ශේෂ පත්‍ර දිනයේ සිට විගණකගේ වාර්තාවේ දිනය දක්වා
- විගණන වාර්තාවේ දිනයේ සිට මූල්‍ය වාර්තා තෙවන පාර්ශවයකට නිකුත් කිරීම
- මූල්‍ය වාර්තා තෙවන පාර්ශවයකට නිකුත් කළ පසු

# පසුව ඇතිවන සිදුවීම් - SUBSEQUENT EVENTS S.L.Au.S - 560

## හැඳින්වීම

ප්‍රායෝගිකව විගණනයන් සිදු කිරීමේ ශේෂපත්‍ර දිනයේ සිට විගණකවරයාගේ වාර්තාවේ දිනය දක්වා සිදුවන යම් යම් සිදුවීම් සහ විගණකවරයාගේ වාර්තා දිනයෙන් පසුව සොයා ගන්නා යම් යම් තොරතුරු විගණක විගණනය කරනා ලද මූල්‍ය වාර්තා කිරීම බලපෑම එල්ල කළ හැක. එහි ඒ පිළිබඳව සලකා බැලීමේ වගකීම් මෙම ප්‍රමිතිය තුල අධ්‍යයනය කිරීම මේ ප්‍රධාන කොටස් තුනක් යටතේ අධ්‍යනය කෙරෙයි.

- 1. මූල්‍ය වාර්තා දිනයෙහි සිට විගණකවරයාගේ වාර්තාවේ දිනය දක්වා සිදුවන සිදුවීම්.
- 2. මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට පෙර නමුත් විගණන වාර්තා දිනයෙන් පසු සොයා ගන්නා තොරතුරු.
- 3. මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමෙන් පසු සොයා ගන්නා තොරතුරු.

- **පසුව ඇතිවන සිදුවීමක් යනු කුමක්ද?**

මූල්‍ය වාර්තා දිනයේ සිට විගණකගේ වාර්තාවේ දිනය දක්වා සිදුවන සිදුවීම් සහ විගණකගේ වාර්තාවේ දිනයෙන් පසු සොයා ගන්න තොරතුරු පසු ඇතිවන සිදුවීම් ලෙස හැඳින්වෙයි.

## ශේෂ පත්‍ර දිනයේ සිට විගණකගේ වාර්තාවේ දිනය දක්වා

- මූල්‍ය වාර්තා දිනයේ සිට විගණකගේ වාර්තාවේ දිනය දක්වා මූල්‍ය ප්‍රකාශනයන්හි ගැලපීම් / හෙළිදරව් කිරීම් අවශ්‍ය වන සිදුවීම් පිළිබඳව සළකා බැලීමේ වගකීම විගණක සතුවේ. මෙය සක්‍රීය වගකීමක් වේ
- මෙම නිසා මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් / හෙළිදරව් කිරීම් අවශ්‍ය වන සිද්ධීන් හා හෙළිදරව් කිරීම් හඳුනාගැනීමට පහත සඳහන් ක්‍රියාපටිපාටි, විගණකගේ වාර්තාවේ දිනයට ප්‍රායෝගිකව හැකිතරම් ආසන්න කාලසීමාව තුළ සිදුකර ප්‍රමාණවත් සහ යෝග්‍ය සාක්ෂි ලබාගත යුතුයි
- මූල්‍ය ප්‍රකාශන වලට ප්‍රමාණාත්මක අන්දමේ බලපෑම් ඇතිකරන සිද්ධීන් ගැන විගණක දැනගත් විට මූල්‍ය ප්‍රකාශන තුළ එම සිද්ධීන් නිසිලෙස ගිණුම්ගත කර ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කර ඇත්දැයි සළකා බැලීම.

→ මූල්‍ය ප්‍රකාශන වල බලපෑම් ඇතිවන සිද්ධීන් කිසිවක් පසුව සිදු වී ඇත් ද යන්න කළ විමසීම සහ එම සිද්ධීන් හඳුනා ගැනීමට කළමනාකාරීත්වය ගෙන ඇති ක්‍රියාපටිපාටි සමාලෝචනය කිරීම්

→ නඩු කටයුතු හා වන්දි ඉල්ලීම් සම්බන්ධයෙන් ආයතනයේ නීතිඥවරුන්ගෙන් විමසීම සහ ඒ පිළිබඳව ලිඛිත ප්‍රතිචාරයන් ලබා ගැනීම්

→ කාලපරිච්ඡේදය අවසානය පසුව පැවති කොටස්හිමියන්ගේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අනෙකුත් විධායක කමිටුවල රැස්වීම් වාර්තා පරීක්ෂා කර එහි පසුව ඇති වූ සිදුවීම් පිළිබඳව කරුණු සාකච්ඡා කර ඇත්දැයි විමසීම.

## මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට කලින් නමුත් විගණකවරයාගේ වාර්තාවේ දිනෙන් පසු සොයාගන්නා තොරතුරු

- විගණකරයාගේ වාර්තාවේ දිනයෙන් පසු මූල්‍ය ප්‍රකාශන පිළිබඳව කිසිඳු අන්දමක ක්‍රියාපටිපාටියක් ඉටු කිරීමට / කිසිඳු විමසීමක් කිරීමට විගණකට කිසිඳු අන්දමක වගකීමක් නැත. මෙහිදී විගණකවරයාගේ වාර්තාවේ දිනය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කරන දිනය අතර මූල්‍ය ප්‍රකාශන වලට බලපෑම් කරන සිදුවීම් පිළිබඳව විගණකවරයා දැනුවත් කිරීමේ වගකීම කළමනාකරණය සතුවේ. ඉන්පසු විගණක වගකීම ආරම්භ වේ.
- මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක අන්දමෙන් බලපෑම් ඇති කරන කරුණු පිළිබඳව විගණකවරයාගේ වාර්තාවේ දිනයට පසු, එහෙත් මූල්‍ය වාර්තා නිකුත් කිරීමට පෙර විගණකවරයා දැනුවත් වන විට, මූල්‍ය ප්‍රකාශන සංශෝධනය කිරීම අවශ්‍යවේද යන්න සළකා බලා කළමනාකරණය සමග කරුණු සාකච්ඡා කර අවස්ථානුකූලව ක්‍රියාමාර්ගයන් ගත යුතුවේ.
- කළමනාකරණය මූල්‍ය වාර්තා සංශෝධනය කරන විට විගණකවරයා අවස්ථානුකූලව අවශ්‍ය වන ක්‍රියාපටිපාටීන් ඉටුකර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන මත නව වාර්තාවක් කළමනාකරණය වෙත සපයනු ඇත. මෙහිදී සංශෝධිත මූල්‍ය ප්‍රකාශන අනුමත කරන දිනයට වඩා කලින් නොවන දිනයක් විගණකගේ වාර්තාවේ දිනය ලෙස යොදන අතර ඉහත සඳහන් කරන ලද ක්‍රියාපටිපාටි නව දිනය තෙක් ව්‍යාප්ත වනු ඇත. මූල්‍ය ප්‍රකාශන සංශෝධනය කළ යුතු යැයි විගණක විශ්වාස කරන විටක සහ විගණකගේ වාර්තාව ආයතනයට නිකුත් කර නොමැති විට, කළමනාකරණය ඒවා සංශෝධනය නොකරන්නේ නම් තත්ත්වාගණනය කළ මතයක් හෝ අහිතකර මතයක් පළ කළ යුතුවේ.
- විගණකවරයාගේ වාර්තාව ආයතනයට නිකුත් කර ඇති විට මූල්‍ය ප්‍රකාශන සහ එයට අදාළ විගණකගේ වාර්තාව තෙවන පාර්ශවයකට නිකුත් නොකරන ලෙස විගණකවරයා ආයතනයේ සමස්ත පාලනය සම්බන්ධයෙන් අවසාන වගකීම දරන පාර්ශවයන්ට දැනුම්දෙනු ඇත. ආයතනය විසින් ඊට පසුව ද මූල්‍ය වාර්තා නිකුත් කරනු ලබන්නේ නම්, විගණකගේ වාර්තාව මත විශ්වාසය තැබීම වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට විගණකට සිදුවනු ඇත. ගනු ලබන ක්‍රියාමාර්ග විගණකගේ නෛතික අයිතිවාසිකම් හා වගකීම්, නීතිඥයින්ගේ නිර්දේශ මත රඳා පවතිනු ඇත.

## මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමෙන් පසු සොයාගන්නා තොරතුරු

- මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමෙන් පසුව එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව කිසිඳු විමසීමක් කිරීමට විගණකවරයා වගකීමෙන් බැඳී නැත. මෙහිදී ඒ පිළිබඳ මූලික වගකීම කළමනාකරණය සතුවේ.
- විගණකවරයාගේ වාර්තාවේ දින පැවතිය වුවද එම දිනයේ සිට දැන සිටියේ නම් විගණකවරයාට විගණකගේ වාර්තාව වෙනස් කිරීමට සිදුවන්නා වූ කරුණක් ගැන මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමෙන් පසු විගණකවරයාට දැන ගැනීමට ලැබුණහොත් මූල්‍ය ප්‍රකාශ සංශෝධනය කිරීම අවශ්‍යවේද යන්න සළකා බලා කළමනාකරණය සමග එම කරුණ සාකච්ඡා කර අවශ්‍ය පියවර ගත යුතු වේ. මෙහිදී පෙර මූල්‍ය වාර්තා කට්ටලය ලද පාර්ශවයන් දැනුවත් කිරීමක් ද සිදුකළ යුතුවේ.
- කළමනාකරණය මූල්‍ය වාර්තා සංශෝධනය කරන විට විගණක අවස්ථානුකූලව අවශ්‍ය වන ක්‍රියාපටිපාටීන් ක්‍රියාත්මක කරගෙන යන අතර කළින් නිකුත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ විගණකගේ වාර්තාව ලැබූ සෑම අයෙකුටම නිසි තත්ත්වයක් දැනුම්දීමට කළමනාකරණය ගෙන ඇති පියවර සමාලෝචනය කර සංශෝධිත මූල්‍ය වාර්තා මත නව වාර්තාවක් නිකුත් කරනු ඇත.
- කලින් නිකුත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ විගණකවරයාගේ පෙර වාර්තාව සංශෝධනය කිරීමට තුඩුදුන් කරුණ පුළුල් වශයෙන් සාකච්ඡා කරනු ලබන මූල්‍ය ප්‍රකාශනයන්හී වන සටහනකට යොමුව දැක්වෙන “කරුණු අනාවරණය කිරීමේ ඡේදයක්” නව වාර්තාවට ඇතුලත් විය යුතු වේ.
- කළින් නිකුත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත වූ විගණන වාර්තාව ලැබූ සෑම අයෙකුටම නිසි තත්ත්වයක් පිළිබඳව දැනුම් දීමට කළමනාකරණය නිසි පියවර නොගන්නා විට සහ විගණකවරයා සංශෝධනය කළ යුතුයැයි විශ්වාස කරන තත්ත්වයක් යටතේ මූල්‍ය ප්‍රකාශන සංශෝධනය නොකරන විට විගණකවරයාගේ වාර්තාව මත අනාගතයේ විශ්වාසය තැබීම වැළැක්වීමට විගණකවරයා ක්‍රියාමාර්ගයන් ගනු ලබන බව ආයතනවේ සමස්ත පාලනය පිළිබඳව වගකීම දරන පාර්ශවයන්ට විගණක දැනුම් දෙනු ඇත. ගනු ලබන පියවර විගණකගේ නෛතික අයිතිවාසිකම් සහ වගකීම් සහ නීතිඥ නිර්දේශයන් මත රඳා පවතිනු ඇත.